සන්නස

# වත්මන් අර්බුදයේ දුටු නුදුටු පැති ඉදිරි වැඩපිළිවෙළ

*පසුගිය කලාපයෙන්*

ප්‍රශ්නය :- අපි නැවතත් ජ.වි.පෙ. උපාය මාර්ග යට හැරෙමු. ජාතික නිදහස් අරගලය හරහා සමාජවාදයට යනුවෙන් ඉදිරිපත් වෙන උපායමාර්ග යට අනුව ඔබේ මිතුරු බලවේග මොනවාද? මේ අරගලයේ නායකත්වය ගන්නේ කවුද? මේ ගැන පැහැදිලි කිරීමක් කළොත්...

සෝමවංශ අමරසිංහ සහෝදරයා : යළි යටත්විජිතකරණයට එරෙහි අලුත් ජාතික නිදහස් අරගලයක අවශ්‍යතාවය අපි දැනටමත් දක්කා. අධිරාජ්‍යවාදයේ මේ යළි යටත්විජිතකරණ ක්‍රියාවලියට කැමැත්තෙන්ම යටවී ඒ ක්‍රියාවලිය සමග කැමැත්තෙන්ම පෙළ ගැසුණු බලවේග හා පුද්ගලයන් පිළිබඳවත් මේ වන විට අපට හොඳ අවබෝධයක් තිබෙනවා. ඒවා අතර දේශපාලන පක්ෂ, ජාතික හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, ආගමික සංවිධාන, සමහර ජාතික හා ජාත්‍යන්තර මාධ්‍ය තිබෙනවා. ඒ වගේම මේ ක්‍රියාවලියට නොයෙක් අයුරින් දායක වන නොයෙක් තරාතිරමට අයිති පුද්ගලයින් ඉන්නවා. ජාත්‍යන්තර වශයෙනුත්එය එසේම සිදු වෙනවා.

මේ ක්‍රියාවලියට දායක වන ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ පිළිබඳව සලකා බලන විට ඒවා මේ යළි-යටත්විජිතකරණ ක්‍රියාවලිය දියත්වූ 70 දශකයේ සිටම එම ක්‍රියාවලිය සමග දැඩි ලෙස බැඳී සිටියා. සිටිනවා. නමුත් මේ යළි-යටත්විජිතකරණ ක්‍රියාවලියට අවංක ලෙසම එරෙහි වන තනි තනි පුද්ගලයින් මේ පක්ෂ තුළත් වෙනත් සංවිධාන තුළත් සිටීමේ හැකියාවතිබෙනවා.

ප්‍රගතිශීලී, දේශප්‍රේමී, ප්‍රජාතන්ත්‍රවාදී, මානව හිතවාදී, පරිසර හිතවාදී දේශපාලන පක්ෂ, සංවිධාන හා තනි තනි පුද්ගලයින් යළි යටත්විජිතකරණයට එරෙහිව ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද පෙළ ගැසී තිබෙනවා. ශ්‍රී ලංකාවේ පෙළ ගැසීම දෙස බලන විට යළියටත්විජිතකරණ ක්‍රියාවලියට දෙගිඩියාවකින් තොරව එරෙහිව සිටින බලවේග අතුරින් පෙරමුණ ගත යුත්තේත් ගෙන ඇත්තේත් ජනතා විමුක්ති පෙරමුණයි.

ප්‍රශ්නය :- පළමුව ජාතික නිදහස දිනාගත යුතු බවත්, සමාජ පරිවර්තනය පසුවට තැබිය යුතු බවටත්, ජාතික සටන් පාඨ සමග පංති සටන් පාඨ එක්ව ගැනීම වැරදි බවත් ආදී ලෙස න්‍යායිකවත්, යුද්ධය කරන අස්සේ වෙනත් ජනතා අරගල නොකළ යුතු බවට ප්‍රායෝගික තලයේත් ඉදිරිපත් වන අදහස් පිළිබඳව ඔබ පක්ෂයේ මතය කුමක්ද?

ටිල්වින් සිල්වා සහෝදරයා :- ඔය අදහස ඉදිරිපත් කරන්නේ දේශපාලන අවස්ථාවාදීන්, නැත්නම් දේශපාලන තක්කඩින්. ඉතිහාසය පුරාම ලෝකයේ බොහෝ රටවල ඔය අවස්ථාවාදීසුළු ධනේෂ්වර අදෝනාව නගපු අය ඉඳලා තියෙනවා. ඒ නිසා මෙය අලුත් දෙයක් නෙවෙයි.මේ කාරණය තරමක් ගැඹුරු න්‍යායික හා දේශපාලනික විග්‍රහයක් මගින් පැහැදිලි කළ යුතු එකක්. ඒත් කෙටියෙන් හා සරලව සලකා බැලුවොත් ඉහත මතය අවසානයේ සේවය කරන්නේ ප්‍රතිගාමීත්වයට බව ඉතා පැහැදිලියි. වත්මන් යුගයේ අධිරාජ්‍යවාදය පරදා ජාතික නිදහස දිනාගැනීම ජාතික බලවේගවලට පමණක් තනියෙන් කළ හැකි දෙයක් නෙවෙයි. ඒ වගේම වර්තමානයේ ජාතික නිදහස පමණක් වෙනමදිනාගැනීම ද පල රහිතයි. ජාතික නිදහස දිනාගැනීම සමාජ පරිවර්තනයක් සමග ගැටගැසී තිබෙන්නේ ඒ නිසයි. අද අධිරාජ්‍ය විරෝධී බලවේග අතර ශක්තිමත් බලවේග වන්නේ, වැඩකරන ජනතා බලවේග ඇතුළු පන්ති බලවේගයි. ඒ නිසා පන්ති බලවේග තුළට ජාතික මතවාදය හෙවත් දේශප්‍රේමය රැගෙන ගොස් ඔවුන් එකී මතවාදයෙන්ද පෝෂණය කොට ජාතික බලවේග හා ඒකරාශී කර මේ සමස්ත අධිරාජ්‍ය විරෝධී බලවේග අධිරාජ්‍යවාදයට එරෙහිව මෙහෙය විය යුතුයි. එහිදී පන්තිසටන් පාඨ මෙන්ම ජාතික සටන් පාඨ ද යොදාගනිමින් මේ අරගලය කළ යුතු වෙනවා. ජාතික සටන් පාඨ, දේශප්‍රේමය පාවිච්චි නොකොට වියුක්ත පන්ති සටන් පාඨ පමණක් පාවිච්චි කිරීම වැරදි වෙනවා මෙන්ම පන්ති සටන් පාඨ නොමැතිව ජාතික සටන් පාඨ පමණක් යොදාගැනීම ද වැරදි වෙනවා.

ජාතික බලවේගයන්ගෙන් තොරව පන්ති බලවේග වලට පමණක් අප ඉදිරියේ ඇති අභියෝග ජයගැනීමට නොහැකිවාක් මෙන්ම පංති බලවේග වලින් තොරව ජාතික බලවේගවලට පමණක්මේ අරගලය ජය ගැනීමට ද නොහැකියි. ඒ නිසා මේ සියලු බලවේග එක අධිරාජ්‍ය විරෝධීමධ්‍යස්ථානයකට ඒකරාශී කළ යුතු අතර ඊට ඉතාමත් ශක්තිමත් සටන්කාමී දේශපාලන ව්‍යාපාරයක් විසින් නායකත්වය දියයුතු වෙනවා. අධිරාජ්‍ය විරෝධී බලවේග බෙදා වෙන්කර දුර්වල කිරීමෙන් වාසි සැලසෙන්නේ අධිරාජ්‍යවාදයට මිස ජනතාවට නෙවෙයි. සමාජ පරිවර්තනයක් පිළිබඳ විශ්වාස නැති, ඒ සඳහා සියලු අධිරාජ්‍ය විරෝධී හා ප්‍රගතිශීලී බලවේග ඒකරාශී කරමින් ජයග්‍රහණය තෙක් එම බලවේග මෙහෙයවීමට තරම් ධෛර්ය නැති,ඒ සඳහා දීර්ඝ කාලයක් දුෂ්කරතා දරාගෙන කටයුතු කිරීමට නොහැකි, එහෙත් බලයට ආසා කරන අය ඒ සඳහා කෙටි මාවත් සොයනවා. එම කෙටි මාවත් තුළ පුද්ගලයන් කීප

දෙනෙකුට බලය, තනතුරු, වරප්‍රසාද ලබාගත හැකි වුවත් රටකට, ජනතාවකට නිදහස, විමුක්තිය ලබාදිය නොහැකියි. එය අප තේරුම් ගත යුතුයි. අද අවශ්‍ය වෙන්නේ, පවතින ක්‍රමය රකින, පවතින ආණ්ඩුවට කුමක් හෝ තර්කයක් මත ජනතාව ගැට ගසන උපාය මාර්ගයක් නොවෙයි. සැබෑ ලෙසම ජාතික නිදහස දිනීම සඳහා එකතු කළ යුතු බලවේග අධිරාජ්‍යවාදයට එරෙහිව වගේම ව්‍යාප්තවාදයට එරෙහිවත් අධිරාජ්‍යවාදයේ සෘජු දේශීය ඒජන්තයින්ටත්, වක්‍ර ඒජන්තයින්ටත් එරෙහිව ජනතාව පෙළ ගස්වන උපාය මාර්ග යකුයි.

අනෙක් අතට ජාතික බලවේග පන්ති බලවේග වලින් ඉවත් කිරීමට, වෙන් කිරීමට, හුදෙකලා කිරීමට කවුරුන් හෝ උත්සාහ කරනවානම් ඔහු පැහැදිලිවම ප්‍රතිගාමීත්වයේ වුවමනා ඉටු කරන්නෙක් වෙනවා. මෙය ප්‍රායෝගිකව ගත්තත් පැහැදිලි වෙනවා. කොටි පරදන යුද්ධය කරන අතරේ වෙනත් අරගල කළ යුතු නැහැ කියන මතය ප්‍රවේශමෙන් තේරුම්ගත යුතුයි. කොටි පරදන සටනට සැබෑ ලෙසම බාධාකරන අනවශ්‍ය අරගල කෘත්‍රිම ලෙස ආරම්භ කරන්නේනම් එය ගැටලුවක් බව ඇත්ත. පසුගිය කාලේ යුද්ධය කරන අතර සමහරු සාම පා ගමන් ගියේ, ඒවා ඉතා බරපතලයි. ඒත් යුද්ධය කරන අතර අධිරාජ්‍යවාදය ක්‍රියාත්මක වන අනෙක් ක්ෂේත්‍රවල (විශේෂයෙන් ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයේ) මතුවන ගැටලුවලදී අරගල කිරීම අත්‍යවශ්‍යයි. මන්ද ඒවාද, අධිරාජ්‍ය විරෝධී අරගල වන නිසා. උදාහරණලෙස අධ්‍යාපනය විකිණීමට එරෙහි අරගල, ජාතික සම්පත් විකිණීමට, ජල සම්පත විකිණීමට එරෙහි අරගල ගත හැකියි.



සෝමවංශ අමරසිංහ සහෝදරයා

**ඒ වගේම ජනතාව බරපතල ලෙස පීඩාවට පත් කරමින් පාලකයින් අත්තනෝමතික ලෙස නාස්තිකාරී ලෙස කටයුතු කරනවා නම් තම අයිතීන් වෙනුවෙන් අරගල කිරීමට එකී ජන කොටස්වලට අයිතිය තියෙනවා. එය යුද්ධයට බාධාවක් නෙවෙයි. බඩු මිල අඩු කරන ලෙස ඉල්ලා කරන අරගල, සහන ඉල්ලා කරන ගොවි අරගල, වැටුප් ඉල්ලා කරන සේවක අරගලසාධාරණ වන්නේ ඒ අනුවයි. එම අරගල හරහා සවිමත් වන්නේ, සංවිධානය වන්නේ අධිරාජ්‍ය විරෝධී බලවේගයි. යුද්ධය නිමා කරන තුරු අයිතීන් ඉල්ලන්න එපා කියමින් ආණ්ඩුව මහජන මුදල් නාස්ති කරන විට එයට එකඟවීමට කිසිදු දේශප්‍රේමියෙකුට බැහැ.**



ටිල්වින් සිල්වා සහෝදරයා

ඒ වගේම ජනතාව බරපතල ලෙස පීඩාවට පත් කරමින් පාලකයින් අත්තනෝමතික ලෙස නාස්තිකාරී ලෙස කටයුතු කරනවා නම් තම අයිතීන් වෙනුවෙන් අරගල කිරීමට එකී ජන කොටස්වලට අයිතිය තියෙනවා. එය යුද්ධයට බාධාවක් නෙවෙයි. බඩු මිල අඩු කරන ලෙස ඉල්ලා කරන අරගල, සහන ඉල්ලා කරන ගොවි අරගල, වැටුප් ඉල්ලා කරන සේවක අරගලසාධාරණ වන්නේ ඒ අනුවයි. එම අරගල හරහා සවිමත් වන්නේ, සංවිධානය වන්නේ අධිරාජ්‍ය විරෝධී බලවේගයි. යුද්ධය නිමා කරන තුරු අයිතීන් ඉල්ලන්න එපා කියමින් ආණ්ඩුව මහජන මුදල් නාස්ති කරන විට එයට එකඟවීමට කිසිදු දේශප්‍රේමියෙකුට බැහැ. කම්කරුවන්ට මාසයකට රුපියල් 5000කින් වැටුප් වැඩි කිරීම ප්‍රතික්ෂේප කරන ආණ්ඩුව, ඊට මුදල් නැති බව පවසන ආණ්ඩුව, උතුරුමැද හා සබරගමුව පළාත් සභා දෙක නියමිත කාලයට පෙර විසුරුවා හැර එහි ඡන්දය සඳහා විශාල මුදලක් වියදම් කරනවා. එය හරිද? සාක් සමුළුවට කලින් වෙඩි නොවදින වාහන 31ක් සඳහා ආණ්ඩුව රුපියල් කෝටි 100ක් වෙන්කරනවා. ඒවාට ආණ්ඩුවට මුදල් තියෙනවා. ආණ්ඩුව සාක් සමුළුවට කළ වියදම කොයි තරම්ද? විදේශ ඇමතිවරයා විසින් සාක් සමුළුවට පැමිණි නිලධාරීන්ට හා දේශීය ආරාධිතයින් 400කට කෑම වේලක් ලබාදී ඇති අතර එක් පුද්ගලයෙක් සඳහා එක කෑම වේලක වටිනාකම රුපියල් 10,000ක්. වැඩකරන ජනතාවට රුපියල් 5000කින් වැටුප් වැඩි කිරීමට මුදල් නැති ආණ්ඩුව ආරාධිතයින්ට එක් කෑම වේලකට රුපියල් 10,000ක් වියදම් කරන්නේ කෙසේද? ප්‍රශ්නය එයයි. ඒ විතරක් නෙවෙයි පසු-ගිය කාලේ ලෝක වෙළඳපොළේ බොර තෙල් මිල ඉහළ ගියාම එය අවස්ථාවක් කරගෙන බදු බරක් පටවා ලංකාවේ තෙල් මිල ඉහළ දැමූ ආණ්ඩුව දැන් මේ දිනවල ලෝක වෙළඳපොළේ බොර තෙල් බැරලයක මිල (ඩොලර් 30ක් පමණ) අඩු වී තිබිය දී එහි වාසිය ජනතාවට නොදී ඉන්නවා. එය නිවැරදිද?එවැනි කරුණු ගැන කතා කිරීම වැරදිද? ඒ නිසා වැඩකරන ජනයා හෝ වෙනත් ජන කණ්ඩායම් තම අයිතීන් ඉල්ලා අරගල කිරීම යුද්ධයට බාධාවක් ලෙස උපාය මාර්ගයට බාධාවක් ලෙස දකින්නේ ආණ්ඩුවට ආවඩමින් ඉන් යැපීම තම එකම "උපාය මාර්ගය" බවටපත්කරගත් අය පමණයි.

මෙහිදී සමහරු රට හා බඩ ගැන කතා කිරීමට තරම් දුර ගොස් තිබෙනවා. බඩට ඉදිරියෙන්රට තබාගත යුතු යැයි ඔවුන් ජනතාවට කියනවා. පසුගිය වසර 60ක් පුරාම ජනතාව කටයුතු කළේ බඩට ඉදිරියෙන් රට තබමින් තමයි. එහෙත් රටට ඉදිරියෙන් බඩ තබා කටයුතුකළේ, මේ රට පාලනය කළ පාලකයනුයි. දැන් ජනතාවට "බඩ" ගැන කතා කිරීම වාරණය කරන්නේ, දනුත් රටට ඉදිරියෙන් බඩ" තබාගෙන මහජන දේපල ගිලදමන පාලකයින්ගේ බඩ රැකදීමට මිස වෙන දෙයකට නොවේ. ආණ්ඩුවේ වලව්වල බැලමෙහෙවරකම් කරමින්, වලව්වල ඉඳුල්වලින් බඩ පුරවා ගෙන සිටින අයට බඩ ගැන ප්‍රශ්නයක් නැති බව ඇත්ත. එහෙත් කුසගින්නේ ජීවත්වන ජනතාවට බඩ පිළිබඳ ප්‍රශ්නය ද රට පිළිබඳ ප්‍රශ්නය තරම්

ම වැදගත්. ඒ නිසා රට නිදහස් කර ගැනීමේ සටන හා බඩ පිළිබඳ සටන එක් සටනක්

බවට පත් වී තියෙනවා. එහිදී "බඩ" ගැන නොසලකා "රට" ගැන පමණක් සිතන ලෙස ඉල්ලාසිටිය හැක්කේ පාලක පන්තියේ දාසයින් බවට පත් වූවන්ට පමණයි.

ප්‍රශ්නය :- හොඳයි. ඔබ නව ජාතික පෙරමුණක් හැදීමට තීරණය කළේ ඇයි? මේ පෙරමුණ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කළොත්...

සෝමවංශ අමරසිංහ සහෝදරයා : යළි-යටත්විජිතකරණ ක්‍රියාවලියට එරෙහිව ශ්‍රී ලංකා සමාජයේ සියලු ස්තර, හා පුද්ගලයන් ඒකරාශී කළ යුතුයි. ප්‍රගතිශීලීන්, ප්‍රජාතන්ත්‍රවාදීන්, දේශප්‍රේමීන්, මානව හිතවාදීන් හා පරිසර හිතවාදීන් ආදී යළි-යටත්විජිතකරණයට එරෙහිවූ සියලු කොටස් බලමුළු ගැන්විය යුතුයි. මේ ගැන කලිනුත් අපි හුඟක් කරුණු කතා කළා. ජාතික නිදහස් අරගලය ජයගැනීමේ උවමනාවට අනුව අපි පසුගිය කාලයේ බොහෝ ක්‍රියාමාර්ග ගත්තා. උපක්‍රම අනුගමනය කළා. අපි "සන්ධානය හැදුවේ, ඒ සඳහා. මහින්ද රාජපක්ෂ මහතාට ජනාධිපතිවරණයේදී උදව් කළේ, ඒ අරමුණෙන්. ඒත් බලයට ආපු මහින්ද රාජපක්ෂ මහතා ජනතා විමුක්ති පෙරමුණ සමග එක්ව වැඩ කිරීම මගහැර එක්සත් ජාතික පක්ෂයේ පිරිසක් හා එක්ව ජනවරම නොසලකා කටයුතු කරන්න පටන් ගත්තා.

මේ තත්වය තුළ අපට ඒත්තු ගිය දේ තමයි, මේ සම්ප්‍රදායික දේශපාලන පක්ෂ සමග අත්හදාබලන්න තවත් ක්‍රියාමාර්ග ඉතිරිවෙලා නැහැ කියන එක. මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුව දිනෙන් දින ජනතාවට ඒත්තු ගැන්වූයේත් සන්ධාන වැඩපිළිවෙළ සමග වන තමන්ගේ පරස්පරයයි. අනෙක් අතට අප සමාජය පෙළන අර්බුදයන්හි සංකීර්ණත්වය සලකා බැලීමේදී ඒවා ජය ගැනීමකින් තොරව තව දුරටත් මේ සමාජයට ඉදිරියක් ගැන හිතන්න බැහැ. එම අර්බුදයන් අප මත පැටව වූ අධිරාජ්‍යවාදයේ ජාතික හා ජාත්‍යන්තර පෙරමුණු පරාජය කරලීම හුදු එක් දේශපාලන පක්ෂයක කටයුත්තක් පමණක් වන්නේ නැහැ. එවායින් පීඩාවට පත්වන මුළු මහත් සමාජයේම කර්තව්‍යයක්. ජාතික හා ජාත්‍යන්තරඅත්දැකීම් මගින්ද පෙන්වා දෙන්නේ එම තත්වයයි. ඒ අනුව අපටත් අපේ උපක්‍රම වෙනස් කිරීමට සිදුවුණා. තවදුරටත් පැවති උපක්‍රම වලංගු වුණේ නැහැ. ඒ නිසා එකී කාර්යය සඳහා නව උපක්‍රම තේරීමට අවශ්‍ය වුණා. නව බලයක් ගොඩනැගිය යුතු වුණා. ඒ සඳහා වූ පළල්ම පෙරමුණ ලෙස නව ජාතික පෙරමුණ ගොඩ නැගිය යුතුයයි ජනතා විමුක්ති පෙරමුණ ඉතා නිවැරදි ලෙස තීරණය කළා. අපි ඉහතදී සඳහන් කළා වගේම මේ පෙරමුණට යළි යටත්විජිතකරණ විරෝධී කොටස් ඒකරාශී වෙනවා. ප්‍රගතිශීලී, දේශප්‍රේමී, ප්‍රජාතන්ත්‍රවාදී, මානව හිතවාදී, පරිසර හිතවාදී සියල්ලන්ටම මෙහි දොර ඇර තිබෙනවා. තවත් පැහැදිලි කළොත් මේ නව ජාතික පෙරමුණ තුළ රටට හා ජනතාවට ආදරය කරන පූජ්‍ය පූජක පක්ෂය, වැඩ කරන ජනතාව, තරුණයන්, කාන්තාවන්, ශිෂ්‍ය ප්‍රජාව, ගොවි ජනතාව, කර්මාන්ත හිමියන්, ව්‍යාපාර හිමියන්, වෘත්තීයවේදීන්, තාක්ෂණවේදීන්, බුද්ධිමතුන්, සාහිත්‍ය කලාකරුවන්, මාධ්‍යවේදීන් හා සමාජයේ සෙසු ස්තරවලට අයත් වූ සියලු දෙනාටම දොර විවෘතයි. ඒ සියලු දෙනා ඒකරාශී කිරීමයි, අපේ අරමුණ.

මේ නව ජාතික පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කිරීම එහි ප්‍රතිපත්ති සම්පාදක සභාව විසින් කරනු ලබනවා. දැන් ඒ කටයුත්තේ අවසාන අදියරට ළඟා වෙමින් තිබෙනවා. එය ඉතා ඉක්මණින් ජනතාව අතට පත් කරන්න හැකි වේවි.

අවසාන කොටස ලබන කලාපයේ

*ජනතා විමුක්ති පෙරමුණ,*
*ජාත්‍යන්තර අංශය, ඕස්ට්‍රේලියාව*